# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,507 — 1958 අගෝස්තු 29 වැනි සිකුරාදා — 29.8.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඛ කරන ලදි)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1958 අංක 1 දරන කුඹුරු පනත

1958 අංක 1 දරන කුඹුරු පනතේ 61 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව කෘෂිකර්ම සහ ආහාර පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදිතව උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කළ රෙගුලාසි යි.

1958 ජූලි 4 වන දින,
කොළඹ දී ය.

ඩී. පී. ආර්. ගුණවර්දන,
කෘෂිකර්ම සහ ආහාර අමාත්‍ය.

#### රෙගුලාසි

1. මෙම රෙගුලාසි, කුඹුරු පනතේ, 1958 (අංක 1 දරන) රෙගුලාසි නමින් හැඳින් විය හැකි ය.

2. පනතේ 3 (2) වන වගන්තියේ කාර්යයන් සඳහා පහත සඳහන් වන හේතු මෙයින් නියම කරනු ලැබේ :—

(අ) අඳ ගොවියා විසින් ඕනෑ කමින් ම කුඹුර ගැන සැලකිල්ලක් නො දැක්වීම නොහොත් ඊට අනල්ප අලාභ හානි සිදු කිරීම.

(ආ) පොළීමරා උකසක උකස් හිමියකුට කුඹුරේ භුක්තිය බාර දීම.

3. පනතේ 4 (5) වන හා 4 (7) (ඇ) වන වගන්තිවල කාර්යයන් සඳහා පහත සඳහන් වන හේතු මෙයින් නියම කරනු ලැබේ :—

(අ) කුඹුරු හිමියා විසින් ම හෝ සිය පවුලේ කවර අයකු විසින් හෝ වගා කිරීම සඳහා කුඹුර ඕනෑ වීම. එවැනි අවස්ථාවකදී ද—

(i) 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ නියම කරනු ලබන දිනයක දී ක්‍රියාත්මක වන පනතේ විධිවිධාන කුඹුර පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ නොහොත් දිස්ත්‍රික්කවල බල පානා තෙක් එබඳු කුඹුරු හිමියකුට ඉහත කී අන්දමට එකී කුඹුර වගා කිරීමට පිළිවන් කම තිබිය යුතුය. එසේ ම,

(ii) එබඳු කුඹුරු හිමියකුගේ එකම ආදයම් මාර්ගය එකී කුඹුර වගා කිරීම විය යුතුය.

(ආ) කුඹුර වගා කිරීමේ දී අඳකාරයා විසින් ඵලදයී නොවන ක්‍රම අනුගමනය කිරීම.

(ඇ) අඳ ගොවියා විසින් ඕනෑ කමින් ම කුඹුර ගැන සැලකිල්ලක් නො දැක්වීම නොහොත් ඊට අනල්ප අලාභ හානි සිදු කිරීම.

4. පනතේ 4 (6) වන වගන්තියේ කාර්යයන් සඳහා පහත සඳහන් වන හේතු මෙයින් නියම කරනු ලැබේ.—

(අ) කුඹුරු හිමියා විසින් ම නොහොත් ඔහුගේ පවුලේ කවර අයකු හෝ විසින් කුඹුර වගා කිරීම සඳහා කුඹුරේ භුක්තිය භාර ගෙන එසේ වගා කරමින් සිටි බව හා සිටින බව.

(ආ) පොළී මරා උකසක උකස් හිමියකුට කුඹුරේ භුක්තිය බාර දීම.

(ඇ) අඳ කාරයා විසින් ඕනෑ කමින් ම කුඹුර ගැන සැලකිල්ලක් නො දැක්වීම නොහොත් ඊට අනල්ප අලාභහානි සිදු කිරීම.

5. (1) පනතේ 6 (3) (අ) වන වගන්තියේ සඳහන් වන, අනුප්‍රාප්තිකයකු නම් කිරීමේ ලේඛනය, මෙහි එන උපලේඛනයේ ඇති " අ " ආකෘතිපත්‍රයට සාරානුකූල ව විය යුතු ය..

(2) පනතේ 6 (3) (අ) වන වගන්තියේ සඳහන් වන, අනුප්‍රාප්තිකයකු නම් කිරීම අවලංගු කිරීමේ ලේඛනය මෙහි එන උපලේඛනයේ ඇති " ආ " ආකෘතිපත්‍රයට සාරානුකූල ව විය යුතු ය.

(3) ගොවියාගේ අනුප්‍රාප්තිකයකු නම් කිරීම අවලංගු කිරීමේ හා අළුතින් කෙනකු පත් කිරීමේ ඒකාබද්ධ ලේඛනය මෙහි එන උපලේඛනයේ " ඇ " ආකෘතිපත්‍රයට සාරානුකූල ව විය යුතු ය.

6. 5 වන රෙගුලාසියෙහි සඳහන් වන අන්දමේ කුඹුරක් පිළිබඳ ව වූ සෑම ලේඛනයක් ම එම කුඹුර සම්පූර්ණයෙන් ම නොහොත් ප්‍රධාන වශයෙන් ම පිහිටි, ලියා පදිංචි කිරීමේ දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත පිටපත් දෙකකින් යුක්ත කොට ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

7. (1) පනතේ 6 (3) (අ) වන වගන්තියේ සඳහන් කරන ලද ලේඛන ලියා පදිංචි කිරීම සඳහා, සෑම ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනකු විසින් ම, (මෙම රෙගුලාසිවල මින් පසු අනුප්‍රාප්තික ලේකම් පොත ය යි හැඳින් වෙන) ලේකම් පොතක්, මෙහි එන උපලේඛනයේ ඇති ''ඈ'' ආකෘතිපත්‍රයට සරානුකූලව තබා ගෙන භාවිත කළ යුතු ය.

(2) අවශ්‍ය පරිදි නොහොත් පහසු පරිදි, කාණ්ඩ ගණනකට බෙද ද, ලේකම් පොත තබා ගෙන භාවිත කරන ඉඩම් රෙජිස්ට්‍රාර්ගේ දිස්ත්‍රික්කයේ එක් එක් ලියා පදිංචි කිරීමේ කොට්ඨාශයකට එකී කාණ්ඩය බැගින් වෙන් කොට ද අනුප්‍රාප්තික ලේකම් පොත තබා ගත හැක.

8. (1) අනුප්‍රාප්තික ලේකම් පොතේ ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ලේඛනයක ම විස්තර ද, එය ඉදිරිපත් කළ දිනය හා වේලාව ද ඇතුළත් කළ යුතු (මෙහි එන රෙගුලාසිවල මින් පසු අනුප්‍රාප්තික දෛනික පොත නමින් හැඳින් වෙන), පොතක් සෑම ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනකු විසින් ම තබා ගෙන භාවිත කළ යුතු ය.

(2) අනුප්‍රාප්තික ලේකම් පොතෙහි ලියා පදිංචි කිරීම සඳහා, තැපෑලෙන් හෝ කවරයක බහා හෝ ඉදිරිපත් කෙරෙන ලේඛනයක් වනාහි, එම ලේඛනය අඩංගු පැකැට්ටුව විවෘත කරන වේලාවෙහි ඉදිරිපත් කෙරෙන ලේඛනයක් සේ සැලකිය යුතු ය.

(3) අනුප්‍රාප්තික දෛනික පොත වනාහි මෙහි එන උපලේඛනයෙහි ඇති '' ඉ '' ආකෘතිපත්‍රයට සාරානුකූල වූවක් විය යුතු ය.

9. (1) අනුප්‍රාප්තික ලේකම් පොතෙහි ලියා පදිංචි කිරීම සඳහා ලැබුණු සෑම ලේඛනයක ම, ඉඩම් රෙජිස්ට්‍රාර් විසින්—

(අ) අනුපිළිවෙළින් අංක යෙදවිය යුතු ය.

(ආ) තමාගේ නිල මුද්‍රාවෙන් මුද්‍රා තැබවිය යුතුය.

(ඇ) එම ලේඛනයෙහි සඳහන් වන කුඹුර, සම්පූර්ණයෙන් ම නොහොත් ප්‍රධාන වශයෙන් ම පිහිටි ලියා පදිංචි කිරීමේ කොට්ඨාසය සඳහා වෙන් කළ කාණ්ඩයෙහි සහ එම කුඹුර පිළිබඳ පළමු වැනි ලේඛනය ලියා පදිංචි කළ, නොහොත් එම පළමුවැනි ලේඛනය ලියා පදිංචි කිරීම ලියා අවසන් කළ, පිටුවෙහි ලියා පදිංචි කරවිය යුතු ය.

එතකුදු වුවත්—

(අ) ඉඩම් රෙජිස්ට්‍රාර්ට සුදුසු යයි වැටහෙතොත්, එම කුඹුර පිළිබඳ කලින් කළ ලියා පදිංචි කිරීමක් වේ නම් එය හා වර්තමාන ලියා පදිංචි කිරීම සම්බන්ධ කිරීම සඳහා හරස් සඳහන් සටහන් කොට අළුත් පිටුවක ලියා පදිංචි කළ හැකිය.

(ආ) එම කුඹුර පිළිබඳ වූ ලේඛනයක් කලින් ලියා පදිංචි කර නැත් නම්, ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් වෙන් කළ පිටුවක එම ලේඛනය ලියා පදිංචි කළ යුතු ය.

(2) ලියා පදිංචි කළ ලේඛනය පිළිබඳ ව අනුප්‍රාප්තික ලේකම් පොතෙහි ඇතුළත් කළ සටහනට ඉඩම් රෙජිස්ට්‍රාර් අත්සන තැබිය යුතු ය. එසේ ම ලේකම් පොතේ කවර කාණ්ඩයේ කවර පිටුවේ එය ලියා පදිංචි කෙළේ ද යන වගත්, ලියා පදිංචි කෙළේ කවර ස්ථානයක දී ද, කවර දිනක දී ද යන වගත් එම ලේඛනයේ අනුපිටපත් දෙකෙහි ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් මෙසේ සටහන් කළ යුතුය :—

ලියා පදිංචි කරන ලදී $\frac{අ2}{13}$

1958 අප්‍රියෙල් 30 වන දින,

කොළඹ දී ය.

(අත්සන)......................................

ඉඩම් රෙජිස්ට්‍රාර්

(සැ. යු. අ 2 නම්, කාණ්ඩයේ සඳහන යි ; 13, පිටුවේ සඳහන යි)

10. ඉදින් අනුප්‍රාප්තික ලේකම් පොතෙහි ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනයක සඳහන් වන කුඹුරක් පිළිබඳ විස්තරය එම කුඹුර පිළිබඳ ව එම ලේකම් පොතෙහි එන විස්තරයට වෙනස් වේ නම් ද, ඉදින් එම ලේඛනය එම ලේකම් පොතෙහි විස්තර කොට ඇති එම කුඹුර පිළිබඳ ව වූවක් බවට ඉඩම් රෙජිස්ට්‍රාර්ට ඒත්තු යයි නම් ද, ඔහු එම ලේකම් පොතේ එම දෙවන විස්තරය ඇතුළත් එම පිටුවේ එම ලේඛනය ලියා පදිංචි කරවා එම පිටුවේ සටහන් කිරයෙහි ඒ ඒ වෙනස් තැන් පිළිබඳ ව සඳහන් කරවිය යුතු යි.

11. ලේඛනයක් අනුප්‍රාප්තික ලේකම් පොතෙහි ලියා පදිංචි කිරීමෙන් පසු, එම ලේඛනය ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ අයට එහි පිටපත් දෙකින් එකක් දීමට ද, අනික් පිටපත සිය කාර්යාලයෙහි ලිපි ගොනුවට ඇතුළත් කොට වාර්තා වශයෙන් තබා ගැනීමට ද සැලැස්විය යුතු ය.

12. අනුප්‍රාප්තික ලේකම් පොතෙහි ලේඛනයක් ලියා පදිංචි කරනු ලැබූ විට, එකී ලියා පදිංචි කිරීම, එය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ බවට අනුප්‍රාප්තික දෛනික පොතෙහි සඳහන් කොට ඇති දිනයෙහි සහ වේලාවෙහි ලියා පදිංචි කරනු ලැබූ ලෙස සැලකිය යුතු වන්නේ ය.

13. අනුප්‍රාප්තික ලේකම් පොත පරීක්ෂා කර බැලීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ලිපි මාර්ගයෙන් කළ යුතු අතර මතු දැක්වෙන විස්තර ද එහි ඇතුළත් විය යුතු ය:—

(අ) ඉල්ලුම් කරුගේ නම සහ ලිපිනය ;

(ආ) කුඹුරේ නම සහ ප්‍රමාණය ;

(ඇ) කුඹුර පිහිටා ඇති ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය හා ගම හෝ නගරය ; සහ,

(ඈ) කුඹුරේ මායිම් යන මේවා ය.

14. ඉඩම් රෙජිස්ට්‍රාර් ඉදිරියෙහි දී හෝ ඔහු විසින් ඒ සඳහා බලය දුන් නිලධාරියකු ඉදිරියෙහි දී හැර කවරකු විසින් වුව ද අනුප්‍රාප්තික ලේකම් පොත පරීක්ෂා නො කළ යුතු ය.

15. ලේඛනයක් අනුප්‍රාප්තික ලේකම් පොතෙහි ලියා පදිංචි කිරීමේ ගාස්තුව රුපියල් දෙකකුත් ශත 50ක් වන්නේ ය ; එම ගාස්තුව වනාහි ඇලවිය හැකි අවලංගු නොකළ මුද්දර වලින් ගෙවිය යුතුය. එම ලේඛනය ලියා පදිංචි කිරීමෙන් පසුව, එම ලේඛනයේ පිටපත් දෙකින් එම ලේඛනය ලියා පදිංචි කිරීම යදහා ඉදිරිපත් කළ අයට දෙනු ලබන පිටපතේ එකී මුද්දර අලවා, ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධාරියකු විසින් හෝ අවලංගු කළ යුතු ය.

16. අනුප්‍රාප්තික ලේකම් පොත පරීක්ෂා කිරීමේ ගාස්තුව රුපියල් දෙකකුත් ශත පනහක් වන්නේ ය. එම ගාස්තුව වනාහි ඇලවිය හැකි අවලංගු නොකළ මුද්දර වලින් ගෙවිය යුතු ය. පරීක්ෂා කිරීමේ ඉල්ලුම් පතෙහි එම මුද්දර ඇලවිය යුතු ය. ඒවා, ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දුන් නිලධාරියකු විසින් හෝ අවලංගු කළ යුතු ය.

17. පනතේ 14 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමක් සඳහා, කවර කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් වුව ද අනුමත කළ ප්‍රමාණය, (එම ප්‍රමාණය මින් පසු අනුමත කළ ප්‍රමාණය යනුවෙන් හැඳින්වෙනු ඇත) මඩ කළ හැකි කුඹුරක් සම්බන්ධයෙන් නම් මඩ කළ නොහැකි කුඹුරක් සම්බන්ධයෙන් අනුමත කළ ප්‍රමාණයට වඩා කුඩා විය හැකි ය.

18. අවුරුද්දේ දෙමෝසමේ ම වගා කළ හැකි කුඹුරක් සම්බන්ධයෙන් අනුමත කළ ප්‍රමාණය අවුරුද්දේ එක මෝසමක පමණක් වගා කළ හැකි කුඹුරක් සම්බන්ධයෙන් අනුමත කළ ප්‍රමාණයට වඩා කුඩා විය හැකි ය.

19. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කොමසාරිස් සෑහීමට පත් වුවහොත්, තමා සාමාන්‍යයෙන් තීරණය කරන අනුමත කළ ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයක් අනුමත කළ ප්‍රමාණය ලෙස ඔහුට තීරණය කළ හැකි ය;—

(අ) අනුමත කළ ප්‍රමාණයෙන් ලැබෙන ආදායම, කුඹුරු හිමියාගේ එකම ආදායම නොහොත් ප්‍රධාන ආදායම බව හෝ

(ආ) අනුමත කළ ප්‍රමාණය කුඹුරු හිමියාට බාර දුන් පසු අඳ ගොවියාට ඉතිරි වන ප්‍රමාණයෙන් ඔහු ලබන ආදායමට වැඩි ආදායමක් වෙනත් මාර්ග වලින් ඔහු ලබන බව, හෝ

(ඇ) අනුමත කළ ප්‍රමාණය ලෙස තීරණය කළ හැකි වැඩි ම ප්‍රමාණය හැර, එම අනුමත කළ ප්‍රමාණය පිළිබඳ තීරණය ට භාජන වන කුඹුර, සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම හෝ පිහිටි පරිපාලක දිස්ත්‍රික්කය ඇතුළත අක්කර පහකට වැඩි කුඹුරු ප්‍රමාණයක් වගා කිරීමට අඳ ගොවියාට හිමි කමක් ඇති බවත් ය.

20. පනතේ 27 වන වගන්තිය යටතේ, හිඟ බද්ද වෙනුවෙන් ගෙවිය යුතු පොළිය වර්ෂයකට සියයට 6 ක් වන්නේ ය.

21. පනතේ 29 වන වගන්තිය යටතේ තෝරා ගන්නා ගොවි කාරක සභාවේ සාමාජික සංඛ්‍යාව දොළහක් වන්නේ ය.

22. (1) සෑම ගොවි කාරක සභාවක් විසින් ම, එම සභාවට තෝරා පත් කළ යුතු සාමාජිකයන් තේරීම සඳහා නියම කරන ලද දිනට සති අටකට නො අඩු කාලයකට මත්තෙන් (පළමුවන තේරීම සම්බන්ධයෙන් නොවේ) කොමසාරිස් විසින් අනුමත කරනු ලබන අන්දමේ ආකෘතියකින් යුත් මෙහි පහත සඳහන් කරුණු ඇතුළත් දැන්වීමක් එම කාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශය ඇතුළත ප්‍රසිඩ කර හැරීමෙහි ලා ඉතාම සුදුසු යයි කාරක සභාවට පෙනී යන පරිදි ප්‍රසිද්ධ කර හැරිය යුතු ය. ඉහත කී කරුණු නම් :—

(අ) පනතේ 30 වන වගන්තියෙහි සඳහන් වන්නාවූ ද, එවකට වලංගු වී ඇත්තා වූ ද කුඹුරු වල සුදුසු අයිතිකාරයන්ගේ නාම ලේඛනය, කාරක සභාව විසින් ප්‍රතිශෝධනය කෙරෙමින් තිබෙන බව, හා

(ආ) එම ලෙඛනයෙහි නම් සඳහන් වන සෑම අයකු විසින් ම, කොමසාරිස් විසින් අනුමත කරන ආකාරයට හා දැන්වීමෙ සඳහන් කරන කාලය ඇතුළත පහත සඳහන් කරුණු, එනම් :—

(i) ලේඛනයෙහි සඳහන් වන කුඹුරක අයිතිකාරයා හැටියට එහි දක්වා ඇති අයකුගේ අයිතිය පිළිබඳ ව යම් වෙනසක් වී තිබේ ද යන වග සහ එසේ නම්, එම අළුත් අයිතිකාරයාගේ නම හා ලිපිනය, සහ

(ii) ඉදින් එම කුඹුරේ අයිතිය පිළිබඳ ව කිසි දු වෙනසක් වී නැත් නම්, දැන්වීමේ දිනට ඉකුත් වූ සැප්තැම්බර් මස 1 වන දිනට ඉකුත් වූ දොළොස් මස් කාලය තුළ දී මාස හයක අවිච්ඡින්න කාලයක් එම අය එම කාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශයෙහි පදිංචි ව සිටි බව ද කාරක සභාවට දැන්විය යුතු බවත් ය.

(2) (1) වන ඡෙදය යටතේ ප්‍රසිද්ධ කර හරින ලද දැන්වීමකට පිළිතුරු වශයෙන් ඉදිරිපත් කළ ඒ ඒ තොරතුරු ගොවි කාරක සභාවට ලැබුණු විට, අවශ්‍ය යයි තමන්ට හැඟෙන අන්දමේ විභාග පැවැත්වීමෙන් පසු, සුදුසු කම් ඇති අයිතිකරුවන්ගේ ලේඛනය යෝග්‍ය පරිදි වෙනස් කළ යුතු ය.

(3) ගොවි කාරක සභාවකට වනාහි, එම සභාවේ ම මෙහෙයීම අනුව හෝ යම් අයකු විසින් සැලකර සිටින කරුණු අනුව හෝ යථා පරිදි විභාග කිරීමෙන් පසු, අවශ්‍ය යයි තමන්ට හැඟෙන, සුදුසු අයිති කරුවන්ගේ ලේඛනය වෙනස් කළ හැකි ය.

(4) ගොවි කාරක සභාවක් විසින්, සුදුසු අයිතිකරුවන්ගේ ලේඛනයෙහි කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම තෝරා ගනු ලබන සාමාජිකයන් තේරීම සඳහා නියමිත දිනට සතියකට නො අඩු කාලයකට මත්තෙන් කළ යුතු ය. තවද, එසේ වෙනස් කළ බවට එම කාරක සභාවේ සභාපති හෝ ලේකම් හෝ සහතික කළ යුතු ය.

23. (1) සෑම අවස්ථාවක දී ම, සුදුසු අයිති කරුවන්ගේ ලේඛනය හොඳ තත්ත්වයෙන් තබා ගත යුතු ය. එය ගොවි කාරක සභාවේ කාර්යාලයේ හෝ එම කාරක සභාව තීරණය කරන අන්‍ය ස්ථානයක හෝ තැබිය යුතු ය.

(2) සුදුසු අයිතිකරුවන්ගේ ලේඛනය, ගොවි කාරක සභාවේ සභාපති භාරයේ හෝ ලේකම් භාරයේ හෝ භාණ්ඩාගාරික භාරයේ හෝ ඒ සඳහා එම කාරක සභාව විසින් බලය දුන් එම කාරක සභාවේ සේවකයකු භාරයේ හෝ තිබිය යුතු ය.

(3) කොමසාරිස් විසින් හෝ, කොමසාරිස් විසින් බලය දුන් නිලධාරියකු විසින් හෝ සම්පූර්ණයෙන් ම නොහොත් ප්‍රධාන වශයෙන් ම එම ගොවි කාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශයෙහි පිහිටි කුඹුරක අයිතිකරුවකු හෝ ගොවියකු විසින් හෝ යුක්ති සහගත කාල වේලාවන්හි දී පරීක්ෂා කර බැලීම පිණිස ගොවි කාරක සභාව විසින් සුදුසු අයිතිකරුවන් ගේ ලේඛනය ඉදිරිපත් කළ යුතු යි.

(4) සුදුසු අයිතිකරුවන්ගේ ලේඛනය පරීක්ෂා කිරීම වෙනුවෙන් ගාස්තුවක් අය නො කළ යුතු ය.

24. ගොවි කාරක සභාවක් සඳහා තෝරා ගනු ලබන සාමාජිකයන්ගේ පළමුවන තේරීම පිළිබඳ ව පහත සඳහන් වන විධිවිධාන බල පාන්නේ ය :—

(අ) ගොවි කාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශයෙහි සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම හෝ පිහිටි කුඹුරු සම්බන්ධයෙන් පනතේ 29 වන වගන්තිය යටතේ යෝග්‍ය ගොවීන්ගේ ලේඛනයක් ද, එම වගන්තිය යටතේ එම කුඹුරු යෝග්‍ය අයිතිකරුවන්ගේ ලේඛනයක් ද කොමසාරිස් විසින් පිළියෙල කළ පසු, (ආ) දරණ ඡෙදය යටතේ දැන්වීමක් නිකුත් කොට, ගොවි කාරක සභාවට තෝරා ගනු ලබන සාමාජිකයන් තේරීම සඳහා යෝග්‍ය ගොවීන්ගේ රැස්වීමක් ද, යෝග්‍ය අයිතිකාරයන්ගේ රැස්වීමක් ද කොමසාරිස් විසින් තමාට පහසු ඉක්මනින් කැඳවිය යුතු ය.

(ආ) (අ) දරණ ඡෙදයේ සඳහන් කරන ලද දැන්වීම, අඬ බෙර ගසා කට වචනයෙන් හෝ ගොවි කාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශයෙහි භාවිත වන භාෂාවෙන් නොහොත් භාෂාවලින් ලියා එහි ඒ ඒ සුදුසු තැන්වල ප්‍රදර්ශනය කිරීමෙන් හෝ එය ප්‍රසිද්ධ කර හැරීම සඳහා ඉතාම සුදුසු ක්‍රමය යයි කොමසාරිස්ට හැඟෙන අන් ආකාරයකින් හෝ නිකුත් කළ යුතු ය.

(ඇ) යෝග්‍ය ගොවීන්ගේ මුළු ගණනින් හතරෙන් එකක් හෝ යෝග්‍ය අයිතිකරුවන්ගේ මුළු ගණනින් හතරෙන් එකක් හෝ පැමිණිය හොත් මිස, එබඳු යෝග්‍ය ගොවීන්ගේ රැස්වීමක් නො පැවැත්විය යුතු ය.

(ඈ) මෙම් රෙගුලාසිය යටතේ කැඳවනු ලබන සෑම රැස්වීමක ම කොමසාරිස් හෝ ඒ සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් නොහොත් විශේෂයෙන් බලය දෙනු ලැබූ නිලධාරියකු හෝ මූලසුන දැරිය යුතුයි. එවැනි සෑම රැස්වීමක ම මූලසුන දරන නිලධාරියා එම රැස්වීමෙ වාර්තාවක් ලියවා එම වාර්තාවට අත්සන් කොට, එම ගොවි කාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශයේ සහකාර ගොවිජන සේවා කොමසාරිස් ගේ කාර්‍යාලයේ ලිපි ගොනුවට ඇතුළත් කොට තැබිය යුතු ය.

(ඉ) ගොවි කාරක සභාවකට තෝරා ගනු ලබන සාමාජිකයන් තේරීම රහස් ඡන්දයෙන් කළ යුතු ය.

(ඊ) මෙම රෙගුලාසිය යටතේ පවත්වනු ලබන රැස්වීමකට කැඳවනු ලැබ පැමිණ සිටින්නාවූ සෑම අයකුට ම, තෝරා ගැනීම සඳහා එක් කෙනෙකුගේ හෝ ඊට වැඩි දෙනකුගේ හෝ නාම යෝජනා කිරීමට අයිතියක් තිබෙන්නේ ය. (මෙසේ නාම යෝජනා කරනු ලැබූ සෑම අයෙක් ම, මෙම රෙගුලාසිවල මින් පසු අපේක්ෂකයෙක්ය යි හැඳින් වේ.) මෙසේ ඉදිරිපත් කරනු ලැබූ කිසිම නාම යෝජනාවක්, එම රැස්වීමට කැඳවනු ලැබ පැමිණ සිටින අන් අයකු විසින් ස්ථිර කරනු ලැබුව හොත් මිස, බලපවත්වනු නො ලැබේ.

(උ) අපේක්ෂකයන්ගේ නාම යෝජනා කිරීම සම්පූර්ණ වූ විට, රැස්වීමේ මූලසුන දරණ නිලධාරියා අපේක්ෂකයන්ගේ නම ප්‍රකාශ කළ යුතුය.

(ඌ) රැස්වීමට පැමිණ සිටින, ඡන්දය දීමේ අයිතිය ඇති සෑම අයකුට ම එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් ඡන්ද පත්‍රිකාවක් දිය යුතු ය. මෙසේ ඡන්ද පත්‍රිකාවක් ලැබූ අයකු එම අපේක්ෂකයා වෙනුවෙන් එසේ නිකුත් කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවෙහි කතිරයක් ගැසීමෙන් තමා එම අපේක්ෂකයාට පක්ෂව ඡන්දය දෙන බව හැඟවිය යුතුය, නැත හොත්, එම ඡන්ද පත්‍රිකාව හිස්ව තැබීමෙන් තමා එම අපේක්ෂකයාට පක්ෂව ඡන්දය නො දෙන බව හැඟවිය යුතු ය.

(එ) අපේක්ෂකයන් සියල්ලන් ම වෙනුවෙන් ඡන්දය දීම නිම වූ විට, ඔවුන් ලැබූ ඡන්ද සංඛ්‍යාවේ පිළිවෙලින්, අපේක්ෂකයන්ගේ නම් ද, එක් එක් අපේක්ෂකයා ලත් ඡන්ද සංඛ්‍යාව ද, රැස්වීමේ මූලසුන දරණ නිලධාරියා විසින් ප්‍රකාශ කළ යුතු යි. මෙම ඡන්ද සංඛ්‍යාව අනුව, ගොවි කාරක සභාවට තෝරා ගත යුතු අවශ්‍ය සාමාජික සංඛ්‍යාව තීරණය විය යුතු ය. මෙසේ තෝරා ගත් ලෙස තීරණය කරනු ලැබූ අය, ගොවි කාරක සභාවේ සාමාජිකයන් ලෙස නිසියාකාරයෙන් තෝරා ගත් බව මූලසුන දරණ එම නිලධාරියා විසින් ප්‍රකාශ කළ යුතු යි.

(ඒ) මූලසුන දරණ නිලධාරියා විසින් ප්‍රකාශ කළ ප්‍රතිඵල අවසන් වූ ද තීරණාත්මක වූ ද ප්‍රතිඵල වන්නේ ය.

25. (1) පළමුවන තේරීමෙන් පසු, ගොවි කාරක සභාවක් සඳහා තෝරා ගනු ලබන සාමාජිකයන් තෝරා ගන්නා සෑම තේරීමක් සම්බන්ධයෙන් ම, 24 වන රෙගුලාසියේ විධිවිධාන මෙම රෙගුලාසියේ 2 වන ඡෙදයේ ප්‍රතිශෝධනයන්ට යටත් ව, පළමුවන තේරීම සම්බන්ධයෙන් අදාළ වන ආකාරයෙන් ම අදාළ වන්නේ ය.

(2) (1) වන ඡෙදයෙහි සඳහන් වන සෑම තදනන්තර තේරීමක් සම්බන්ධයෙන්ම—

(අ) ඡන්දය දීමේ අයිතිය ඇති, යෝග්‍ය ගොවීහු කවරහු ද යනු, පනතේ 35 වන වගන්තිය යටතේ ගොවි කාරක සභාව විසින් පිළියෙල කොට තබාගෙන ඇත්තා වූ ද එවකට බලපවත්නාවූ ද, අයිතිකාර ගොවීන්, අඳ ගොවීන්, සමූහ ගොවීන් හා ගොවි කම්කරුවන් පිළිබඳ ලේඛනය අනුව තීරණය කළ යුතු ය ; තවද

(ආ) ඡන්දය දීමේ අයිතිය ඇති, යෝග්‍ය අයිතිකාරයෝ කවරහුද යනු, ගොවි කාරක සභාව විසින් පිළියෙල කොට තබාගෙන ඇත්තාවූ ද, එවකට බලපවත්නා වූ ද, යෝග්‍ය අයිතිකාරයන්ගේ ලේඛනය අනුව තීරණය කළ යුතු ය.

26. සෑම ගොවි කාරක සභාවක් ම, එක් එක් මෝසමක් ආරම්භ වීමට යටත් පිරිසෙයින් සති දෙකකට කලින් එක් වරක් ද, ඉන් පසු ව එම මෝසමේ දී යටත් පිරිසෙයින් මසකට වරක් ද රැස්විය යුතු යි.

27. (1) ගොවි කාරක සභාවක සෑම රැස්වීමක ම කටයුතු පිළිබඳ වාර්තාවක් පිළියෙළ කොට ගොවි කාරක සභාවේ කාර්යාලයේ හෝ, ගොවි කාරක කාරක සභාව විසින් තීරණය කළ හැකි සුදුසු අන් කිසි ස්ථානයක හෝ ලේඛනගත කොට තැබිය යුතු ය.

(2) ගොවි කාරක සභාවක රැස්වීමක් සඳහා අවශ්‍ය ගණ පූරණය, එම ගොවි කාරක සභාවේ තෝරා ගත් සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

28. (1) ගොවි කාරක සභාවක් විසින් තීරණය කළ යුතු සියලු ම කරුණු, නිසියාකාරයෙන් කැඳවනු ලැබූ රැස්වීමක දී එහි පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

(2) මෙම පණතේ කවර විධිවිධානයකට හෝ මෙම පනත යටතේ සම්පාදිත කවර රෙගුලාසියකට හෝ පටහැණි නුවූ තීරණයක් යම් කිසි ගොවි කාරක සභාවක් විසින් කළ විට, එම ගොවි කාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශයෙහි පිහිටි කුඹුරුවල සියලු ම කුඹුරු හිමියන් කෙරෙහි ද, ගොවීන් කෙරෙහි ද සමූහ ගොවීන් කෙරෙහි ද, ගොවිකම්කරුවන් කෙරෙහි ද එම තීරණය බලපවත් වන්නේ ය.

29. පනතේ 33(2) වන වගන්තිය යටතේ ලිඛිත අධියාචනයක් ඉදිරිපත් කළ හැකි සාමාජික සංඛ්‍යාව වනාහි, ගොවි කාරක සභාවක් සඳහා තෝරා ගනු ලබන සාමාජිකයන් තේරීමකදී ඡන්දය දීමට, පනතේ 29(2) වන වගන්තිය යටතේ සුදුසුකම් ඇති අයගේ සංඛ්‍යාවෙන් හතරෙන් එකක් විය යුතු ය.

30. පනතේ 35(1) වන වගන්තිය යටතේ පිළියෙල කෙරුණු සහතිකයක්, මෙහි උපලේඛනයෙහි එන ''ඊ'' දරණ ආකෘති පත්‍රයට සාරානුකූල ව විය යුතුය.

31. (1) සිය බලය පවත්නා ප්‍රදේශයෙහි මෝසම ආරම්භ වන දිනයට මසකට නො අඩු කාලයකට මත්තෙන් එම ප්‍රදේශයෙහි සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම හෝ පිහිටි ස්ථානවල ගොවි කම්කරුවන්ගේ දෛනික වේතන ප්‍රමාණයන් නියම කොට, එම කාරක සභාව විසින් තීරණය කරන ආකාරයකට එම ප්‍රදේශයේ එය ප්‍රකාශ කොට හැරිය යුතු ය.

(2) (1) වන ඡෙදය යටතේ වේතන ප්‍රමාණයන් නියම කිරීමේ දී ගොවි කාරක සභාවක් විසින්, ඒ ඒ ගොවි කම්කරු පන්ති සඳහා වෙන් වෙන් ව වේතන ප්‍රමාණයන් නියම කළ හැකි ය ; නැතහොත් ගොවි කම්කරුවන් යොදවනු ලබන, වී නිෂ්පාදනය පිළිබඳ ඒ ඒ කටයුතු සඳහා වෙන් වෙන් ව වේතන ප්‍රමාණයන් නියම කළ හැකි ය.

(3) තමා විසින් සේවයට යොදවනු ලැබූ ගොවි කම්කරුවන්ට කෑම ද චාරිත්‍රයක් වශයෙන් සේවයෝජකයා විසින් සපයනු ලබන සෑම ප්‍රදේශයක ම, (1) වන ඡෙදය යටතේ වේතන ප්‍රමාණයන් නියම කිරීමේ දී, ගොවි කාරක සභාව විසින්, එසේ නියම කරනු ලැබූ වේතන ප්‍රමාණවලට කෑම වියදමක් ඇතුළත් වේ ද නොවේ ද යන වග සඳහන් කළ යුතු ය. එසේ නියම කරනු ලැබූ වේතන ප්‍රමාණවලට කෑම වියදම ඇතුළත් නොවේ නම්, එක් එක් ගොවි කම්කරුවාට ඔහුගේ සේවයෝජකයා විසින් සැපයිය යුතු කෑම වේල් ගණනත්, එම කෑම කවර ස්වභාවයක ඒවා විය යුතු ද යනුත් ගොවි කාරක සභාව විසින් සඳහන් කළ යුතු ය.

(4) මෙම රෙගුලාසියේ කාර්‍ය්‍යයන් සඳහා, යම් ප්‍රදේශයක මෝසම ආරම්භ වන දිනය වනාහි, එම ප්‍රදේශයේ ඒ ඒ සී සෑමේ කටයුතු නොහොත් මඩ කිරීමේ කටයුතු ආරම්භ කරන දිනය වශයෙන් සැලකිය යුතු වන්නේ ය.

මෙම ඡෙදයෙහි එන ''මඩ කිරීමේ කටයුතු'' යන්නෙන් අදහස් වන්නේ වී වැපිරීමට පෙර කුඹුරු සෑම සාමාන්‍යයෙන් නො කෙරෙන ප්‍රදේශවල කවර ප්‍රමාණයක කුඹුරක හෝ වී වැපිරීම සඳහා පස සකස් කිරීම වශයෙන් කරනු ලබන කටයුතු යි.

32. පණතේ 36(1) (ඇ) වන වගන්තිය යටතේ පැනවිය හැකි ගාස්තු ප්‍රමාණය, එක් එක් මෝසම වෙනුවෙන් අක්කරයකට රු. 6 බැගින් වන්නේ ය.

33. පනතේ 36(1) (එ) වන වගන්තියේ කාර්යයන් සඳහා කොන්දේසි පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) ගොවි කාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශයෙහි පිහිටා ඇති කුඹුරු වෙනුවෙන් 1946 අංක 32 දරණ වාරිමාර්ග ආඥපණත යටතේ ගෙවිය යුතු (මෙම රෙගුලාසියෙහි මින් පසු ''දිය බද්ද'' යැයි සඳහන් වන) ජලය සැපයීම පිළිබඳ අය කිරීම් හෝ මුදලින් ගෙවන සහාගයන් හෝ වෙනත් මුදල් ගණන් හෝ එම ප්‍රදේශය පිහිටා ඇති පරිපාලක දිස්ත්‍රික්කයෙහි ආණ්ඩුවේ ඒජන්ත උදෙසා එම ගොවි කාරක සභාව විසින් අය කළ යුතු වූ විට, කවර දිනක සිට එම ගොවි කාරක සභාව විසින් එම දිය බද්ද අය කළ යුතු දැයි ආණ්ඩුවේ ඒජන්ත විසින් තීරණය කළ යුතු ය;

(ආ) දිය බද්ද අය කරන සෑම ගොවි කාරක සභාවක් විසින් ම කලින් කල ආණ්ඩුවේ ඒජන්තට යවන අය කළ මුළු මුදල් වලින් සියයට දහයක කොමිසක් එම ගොවි කාරක සභාවලට ලැබිය යුතු වන්නේ ය.

34. (1) ගොවි කාරක සභාවක රැස්වීමක් කැඳවීම අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි හෝ තමාට වැටහෙන කවර විටක දී වුව ද, එම රැස්වීමේ වේලාව හා දිනය පිළිබඳ ව දවස් හතකට නො අඩුව කල් ඇතිව දන්වා කවර ගොවි කාරක සභාවක වුව ද රැස්වීමක් කැඳවීමට කොමසාරිස්ට බලය තිබේ.

(2) තමා විසින් තීරණය කරන ප්‍රදේශයක ගොවි කාරක සභාවල අන්‍යෝන්‍ය යහපත ඇති කරලීම සඳහා ද, එම ප්‍රදේශයෙහි වී ගොවිතැන සම්බන්ධයෙන් පොදුවේ බල පවත්වන කාරණා ගැන සාකච්ඡා කිරීම සඳහා ද, එම ප්‍රදේශයේ ගොවි කාරක සභාවල නියෝජිතයන්ගෙන් සැදුණු සම්මේලනයක්, අවශ්‍ය ය යි හෝ අවස්ථානුකූලය යි හෝ තමා ට හැඟෙන කවර විටක දී වුව ද සංවිධානය කිරීමට කොමසාරිස්ට බලය තිබිය යුතු වන්නේ ය. එම සම්මේලනය වනාහි, එම ප්‍රදේශයෙහි ඇති එක් එක් ගොවි කාරක සභාවක සාමාජිකයන් අතුරෙන් එම ගොවි කාරක සභාව විසින් තෝරාගත් නියෝජිතයන්ගෙන් සමන්විත විය යුතු ය. එම එක් එක් ගොවි කාරක සභාවකින් එසේ තෝරා ගත් නියෝජිතයන් ගේ සංඛ්‍යාව තුනකට වැඩි නොවිය යුතු ය. එම සම්මේලනයේ දී කරනු ලබන සෑම තීරණයක් ම, සලකා බැලීම සඳහා, එම සම්මේලනයට නියෝජිතයන් එවූ එක් එක් ගොවි කාරක සභාවකට යැවිය යුතු ය.

35. පනතේ 52(අ) දරණ වගන්තිය යටතේ දෙනු ලබන ණයක් වෙනුවෙන් අය කළ හැකි වැඩිම පොළී ප්‍රමාණය වනාහි,

(අ) ඉදින් වී වලින් දුන් ණයක් නම්, එසේ ණයට දුන් වී ප්‍රමාණයෙන් මෝසමකට සියයට දහයක් ද,

(ආ) ඉදින් මුදලින් දුන් ණයක් නම් වර්ෂයකට සියයට හයක් ද විය යුතු ය.

36. පනතේ 56 වන වගන්තියේ කාර්‍ය්‍යයන් සඳහා, කුඹුරක වාර්ෂික බදු වටිනාකම වනාහි, එම කුඹුරේ අඳ ගොවියා විසින් පනත යටතේ ගෙවිය යුතු වාර්ෂික බද්දට සම වන මුදලක් විය යුතු ය.

37. (1) පනතේ 57 වන වගන්තියේ (1) වන, (2) වන හා (3) වන උප වගන්තිවල කාර්යයන් සඳහා පහත දැක්වෙන හේතුව මෙයින් නියම කරනු ලැබේ :—

විකිණීම සඳහා රජයට ඉදිරිපත් කර ඇති කුඹුරෙන් ලැබෙන ආදායම අඩුවීමේ හේතුවෙන් කුඹුරු හිමියා දුෂ්කරතාවට පත්වීම, එය ද පහත සඳහන් අවස්ථාවලදී විය යුතුය :—

(අ) එම ආදායම අඩුවීම එසේ විකිණීමට ඉදිරිපත් කළ දිනට ඉකුත් වූ තුන් අවුරුද්ද තුළ එම කුඹුරු හිමියා විසින් ලැබූ වාර්ෂික සාමාන්‍ය ආදායමෙන් අඩකට වැඩි පමණින් වීම,

(ආ) එම ආදායම අඩුවීම හුදෙක් කුඹුරු පනත ක්‍රියාවේ යෙදීමෙන් ම සිදු වූවක් වීම, හා

(ඇ) එම කුඹුර තමාගේ ප්‍රධාන ආදායම් මාර්ගය වීම ද වේ.

(2) පනතේ 57 වන වගන්තියේ (3) වන උප වගන්තියේ කාර්‍ය්‍යයන් සඳහා කුඹුරක වාර්ෂික බදු වටිනාකම වනාහි, 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ එම කුඹුර අත්කර ගත් දිනට ඉකුත් වූ තුන් අවුරුද්ද වෙනුවෙන් එම කුඹුරෙන් ලැබුණු වර්ගයේ වී වර්ග සඳහා, කොමසාරිස්වරයා විසින් සහතික කළ මිල ක්‍රමයේ කාර්‍ය්‍යයන් සඳහා ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින් නියම කරනු ලැබූ මිල ගණන් වල සාමාන්‍යය අනුව ගිණූ, එම් තුන් අවුරුද්ද තුළ එම කුඹුරෙන් ලැබුණු වාර්ෂික දළ අස්වැන්නේ සාමාන්‍යය හා සම ගණනක් විය යුතු ය.

38. (1) පනතේ 59(1) වන වගන්තියෙහි සඳහන් වන සමීක්ෂණ මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව තුනක් විය යුතු ය.

(2) කලින් ඉල්ලා අස්වුව හොත් , නොහොත් නිලයෙන් පහ කරනු ලැබුව හොත් හැර, සමීක්ෂණ මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම අවුරුද්දක ධුර කාලයක් ධුරය ඉසිලිය යුතු ය.

(3) ධුර කාලය ගෙවී යාමෙන් ධුරයෙන් ඉවත් ව යන සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙක් එම මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේ ය.

(4) අමාත්‍යවරයාට ලියුමක් ලිවීමෙන්, සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකුට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) ගැසට් පත්‍රයෙහි නියෝගයක් පළ කරවීමෙන් අමාත්‍යවරයාට, සමීක්ෂණ මණ්ඩලයේ කවර සාමාජිකයකු වුව ද, හේතුවක් නො දක්වා ධුරයෙන් අස් කළ හැකිය.

(6) (5) වන ඡෙදය යටතේ යම් සාමාජිකයකු පිළිබඳ ව නියෝගයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබී ද, එම නියෝගය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දින ඔහු ධුරය අත්හැරිය යුතුය.

(7) අමාත්‍යවරයා විසින් ධුරයෙන් අස් කරනු ලැබූ, සමීක්ෂණ මණ්ඩලයේ කවර සාමාජිකයෙක් වුව ද, එම මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කරනු ලැබීමට සුදුසු නොවන්නේ ය.

39. සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් කෙනකු එම මණ්ඩලයේ සභාපති ලෙස අමාත්‍යවරයා විසින් පත් කළ යුතු ය.

40. සමීක්ෂණ මණ්ඩලයේ ලේකම් ලෙස, ඒ සඳහා අමාත්‍යවරයා විසින් පත් කළ ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරියකු ක්‍රියා කළ යුතු ය.

41. (1) සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන සෑම ඇපෑලක්ම ලිපියකින් මණ්ඩලයේ ලේකම් නමට ඉදිරිපත් කළ යුතු ය. සමීක්ෂණ මණ්ඩලය විසින් එම ඇපෑල සලකා බැලීම සඳහා දිනය ද, වේලාව හා ස්ථානය ද, ලේකම් විසින් මණ්ඩලයේ සභාපති හා සමග සාකච්ඡා කොට නියම කළ යුතු ය.

(2) සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කොට ඇති ඇපෑල් විභාග කොට තීරණය කිරීම සඳහා, මණ්ඩලයේ ලේකම් විසින්, එහි සභාපතිගේ විධානය යටතේ ම මණ්ඩලයේ රැස්වීම් කැඳවිම් යුතු ය.

(3) සමීක්ෂණ මණ්ඩලය විසින් කරනු ලබන සෑම තීරණයක් සඳහා ම උපයෝගී කරගත් හේතු ද ඊට ඇතුළත් කළ යුතු ය. එම සෑම තීරණයකට ම මණ්ඩලයේ සභාපති අත්සන් කළ යුතු ය.

(4) සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන සෑම ඇපෑලක් සම්බන්ධයෙන් ම මණ්ඩලයෙහි දී කෙරෙන කටයුතු පිළිබඳ වාර්තාවක් ලේකම් විසින් තබාගත යුතු ය.

(5) සමීක්ෂණ මණ්ඩලය විසින් ඇපෑලක් විභාග කොට තීරණය කළ වහා ම, මණ්ඩලයේ ලේකම් විසින් එම ඇපෑල පිළිබඳ ව මණ්ඩලයේ එම තීරණය ඇපෑල්කරුට ලියා දන්විය යුතු ය.

(6) සමීක්ෂණ මණ්ඩලයේ රැස්වීම්වල දී කවර කාර්ය පරිපාටියක් අනුගමනය කළ යුතු ද යනු, මෙම රෙගුලාසියේ විධිවිධානයන්ට යටත් ව, සමීක්ෂණ මණ්ඩලය විසින් නියම කළ හැකි ය.

42. මෙම රෙගුලාසිවල එන—

" පනත " යන්නෙන්, 1958 අංක 1 දරන කුඹුරු පනත අදහස් කෙරේ.

" කොමසාරිස් " යන්නෙන් ගොවි ජන සේවා කොමසාරිස් අදහස් කෙරේ.

## උපලේඛනය

### " අ " ආකෘති පත්‍රය

#### අනුප්‍රාප්තිකයකු නම් කිරීමේ ආකෘති පත්‍රය

මෙහි මීට යා කොට ඇති උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කොට ඇත්තාවූ ද,————පදිංචි————ට දනට අයත් වූ ද,————නමැති කුඹුරේ අඳ ගොවියා වූ————පදිංචි————වන මම, 1958 අංක 1 දරණ කුඹුරු පනත යටතේ, එකී කුඹුරේ අඳ ගොවියා වශයෙන් මට ඇති අයිතිවාසිකම් මගේ මරණයෙන් පසු ලැබිය යුතු තැනැත්තා හැටියට————පදිංචි————මෙයින් නම් කරමි.

————,
අඳ ගොවියාගේ අත්සන.

සාක්ෂිකාරයන් දෙදෙනකුගේ නම් හා ලිපිනයන් :

1.————. අත්සන :————.

2.————. අත්සන :————.

19————මස————වන දින මා ඉදිරියෙහි දී අත්සන් කරන ලදී.

————පරිපාලක දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත/
————ප්‍රාදේශීය ආදායම් නිලධාරි/ඉඩම් රෙජිස්ට්‍රාර්/ප්‍රසිද්ධ නොතාරිස්/සාමදාන විනිශ්චයකාර.

## උපලේඛනය

1. කුඹුරේ නම :————.

2. කුඹුරේ පිහිටීම—
   (අ) ගම හෝ නගරය :————.
   (ආ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :————.
   (ඇ) පරිපාලක දිස්ත්‍රික්කය :————.

3. කුඹුරේ මායිම්—
   උතුරට :————.
   දකුණට :————.
   නැගෙනහිරට :————.
   බස්නාහිරට :————.

4. ප්‍රමාණය :————.

5. මීට අදාළ කොටස :————.

6. සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම හෝ කුඹුර පිහිටි යේ කිනම් ගොවි කාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශයේ ද?————.

### "ආ" ආකෘති පත්‍රය

**අනුප්‍රාප්තිකයකු නම් කිරීම අවලංගු කිරීමේ ආකෘති පත්‍රය**

මෙහි මීට යා කොට ඇති උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කොට ඇත්තා වූ ද,————පදිංචි————ට දනට අයත් වූ ද,————නමැති කුඹුරේ අඳ ගොවියා වූ,————පදිංචි————වන මම, 1958 අංක 1 දරණ කුඹුරු පනත යටතේ එකී කුඹුරේ අඳ ගොවියා වශයෙන් මට ඇති අයිතිවාසිකම් මගේ මරණයෙන් පසු ලැබිය යුතු තැනැත්තා හැටියට,————පදිංචි————නම් කරමින්,————දී————ඉදිරියෙහි දී 19————මස————වන දින ම විසින් අත්සන් කළ ලියවිල්ලෙන් කළ නම් කිරීම මෙයින් අවලංගු කරමි.

————,
අඳ ගොවියාගේ අත්සන.

සාක්ෂිකාරයන් දෙදෙනකුගේ නම් හා ලිපිනයන් :

1.————. අත්සන :————.

2.————. අත්සන :————.

19————මස————වන දින මා ඉදිරියෙහි දී අත්සන් කරන ලදී.

————පරිපාලක දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත/
————ප්‍රාදේශීය ආදයම් නිලධාරි/ඉඩම් රෙජිස්ට්‍රාර්/ප්‍රසිද්ධ නොතාරිස්/සාමදාන විනිශ්චයකාර.

#### උපලේඛනය

1. කුඹුරේ නම :————.
2. කුඹුරේ පිහිටීම—
   (අ) ගම හෝ නගරය :————.
   (ආ) ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය :————.
   (ඇ) පරිපාලක දිස්ත්‍රික්කය :————.
3. කුඹුරේ මායිම්—
   උතුරට :————.
   දකුණට :————.
   නැගෙනහිරට :————.
   බස්නාහිරට :————.
4. ප්‍රමාණය :————.
5. මීට අදාළ කොටස :————.
6. සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම හෝ කුඹුර පිහිටියේ කිනම් ගොවි කාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශයේද ?
   ————.

---

### "ඇ" ආකෘති පත්‍රය

**අනුප්‍රාප්තිකයාගේ නම් කිරීම අවලංගු කිරීම හා නව අනුප්‍රාප්තිකයකු නම් කිරීම ඒකාබද්ධ කිරීමේ ආකෘති පත්‍රය**

මෙහි මීට යා කොට ඇති උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කොට ඇත්තාවූ ද,————පදිංචි————ට දනට අයත් වූ ද————නමැති කුඹුරේ අඳ ගොවියා වූ————පදිංචි————වන මම,

(අ) 1958 අංක 1 දරණ කුඹුරු පනත යටතේ එකී කුඹුරේ අඳ ගොවියා වශයෙන් මට ඇති අයිතිවාසිකම් මගේ මරණයෙන් පසු ලැබිය යුතු තැනැත්තා හැටියට————පදිංචි————නම් කරමින්————දී————ඉදිරියේ 19————මස————වන දින ම විසින් අත්සන් කළ ලියවිල්ලෙන් කළ නම් කිරීම මෙයින් අවලංගු කොට,

(ආ) එකී පනත යටතේ එකී කුඹුරේ අඳ ගොවියා වශයෙන් මට ඇති අයිතිවාසිකම් මගේ මරණයෙන් පසු ලැබිය යුතු තැනැත්තා හැටියට————පදිංචි————මෙයින් නම් කරමි.

————,
අඳ ගොවියාගේ අත්සන.

සාක්ෂිකාරයන් දෙදෙනකුගේ නම් හා ලිපිනයන් :

1. ————. අත්සන:————.
2. ————. අත්සන:————.

19————මස————වන දින මා ඉදිරියෙහි දී අත්සන් කරන ලදී.

————පරිපාලක දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත/
————ප්‍රාදේශීය ආදයම් නිලධාරි/ඉඩම් රෙජිස්ට්‍රාර්/ප්‍රසිද්ධ නොතාරිස්/සාමදාන විනිශ්චයකාර.

#### උපලේඛනය

1. කුඹුරේ නම :————.
2. කුඹුරේ පිහිටීම—
   (අ) ගම හෝ නගරය :————.
   (ආ) ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය :————.
   (ඇ) පරිපාලන දිස්ත්‍රික්කය :————.
3. කුඹුරේ මායිම්—
   උතුරට :————.
   දකුණට :————.
   නැගෙනහිරට :————.
   බස්නාහිරට :————.
4. ප්‍රමාණය :————
5. මීට අදාළ කොටස :————.
6. සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම හෝ කුඹුර පිහිටියේ කිනම් ගොවි කාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශයේ ද?
   ————.

## "ඇ" ආකෘති පත්‍රය

**1958 අංක 1 දරන කුඹුරු පනතේ 6 වන වගන්තිය යටතේ තැබිය යුතු නම් කිරීම් හා අවලංගු කිරීම ලේඛනය යි**

කුඹුරේ නම :————.

ගම හෝ නගරය :————.

ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :————.

පරිපාලක දිස්ත්‍රික්කය :————

සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම හෝ කුඹුර පිහිටියේ කිනම් ගොවි කාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශයේ ද? :————.

මායිම් :

උතුරට :————,

දකුණට :————,

නැගෙනහිරට :————,

බස්නාහිරට:————,

ප්‍රමාණය :————.

| ලියාපදිංචි කිරීමේ දිනය | අයිතිකාරයාගේ නම හා ලිපිනය | අඳගොවියාගේ නම හා ලිපිනය | පනතේ 6(1) වන වගන්තිය යටතේ නම් කළ අනුප්‍රාප්තිකයාගේ නම හා ලිපිනය | පනතේ 6(2) වන වගන්තිය යටතේ නම් කිරීම අවලංගු කළ අනුප්‍රාප්තිකයාගේ නම හා ලිපිනය | ඊට අදාළ කොටස | ලියවිල්ල අත්සන් කළ දිනය හා එය කවරකු ඉදිරියේ අත්සන් කළේ ද යන වග | රෙජිස්ට්‍රාර්ගේ අත්සන | වෙනත් කරුණු වෙතොත් ඒවා |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| | | | | | | | | |

---

## "ඉ" ආකෘති පත්‍රය

**ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන, 1958 අංක 1 දරන කුඹුරු පනතේ 6 (3) (අ) වගන්තිය යටතේ ලියා අත්සන් කරන ලේඛනවල විස්තර**

| අනුක්‍රමික අංකය | ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ දිනය හා වේලාව | ලේඛනය අත්සන් කළ දිනය හා එය කවරකු ඉදිරියේ අත්සන් කළේ ද යන වග | ලේඛනයේ සවභාවය: නම් කිරීමක් ද අවලංගු කිරීමක්ද අවලංගු කොට නම් කිරීමක් ද යන වග | ලියා පදිංචි කිරීමේ ගාස්තුව | ඊට අදාළ කුඹුරු ගණන | ලියා පදිංචි කිරීමෙන් පසු ලේඛනය ආපසු යැවූ දිනය | වෙනත් කරුණු වෙතොත් ඒවා |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| | | | | | | | |

"ඊ" ආකෘති පත්‍රය

**1958 අංක 1 දරන කුඹුරු පනතේ 35(1) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන තත්වය පිළිබඳ සහතිකය යි**

————මයා, මීට යා කොට ඇති උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කොට තිබෙන————නමැති කුඹුරේ, අයිතිකාර ගොවියා*/අඳ ගොවියා*/සමූහ ගොවියා*/ගොවිකම්කරුවා* බව————ගොවි කාරක සභාව මෙයින් සහතික කරයි.

————,
ලේකම්.

————,
ගොවි කාරක සභාව.

දිනය :————.

ස්ථානය :————.

උපලේඛනය

1. කුඹුරේ නම :————.

2. අයිතිකාරයාගේ නම :————.

3. කුඹුරේ පිහිටීම :

(අ) ගම හෝ නගරය :————.

(ආ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :————.

(ඇ) පරිපාලක දිස්ත්‍රික්කය :————.

4. මායිම් :

උතුරට :————.

දකුණට :————.

නැගෙනහිරට :————.

බස්නාහිරට :————.

5. ප්‍රමාණය :————.

6. මීට අදාළ කොටස :————.

7. සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම හෝ කුඹුර පිහිටියේ කිනම් ගොවිකාරක සභාවේ බලය පවත්නා ප්‍රදේශයේ ද ?

————

*නොගැළපෙන කොටස කපා දමන්න.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී